## ණය මුදල ලබා ගැනීම ( 85% උපරිමයකට යටත්ව ) උපදෙස්/ පිරික්සුම් පත්‍රිකාව

## ප්‍රතිපත්ති

- තැන්පතු මුදල අවම රු:100,000.00 (රුපියල් ලක්‍ෂය) හෝ වසර 5 ක අඛණ්ඩ යුද්ධ හමුදා සේවා කාලයක් සම්පූර්ණ කල යුතුය.
- ඉදිරි සේවා කාලය අවම වශයෙන් වසරක් තිබිය යුතුය.
- වැටුප් බැරවන ගිණුමට පමණක් මුදල් බැරකරනු ලැබේ.
- අවම වාරික 12 සහ උපරිම වාරික 120 කට යටත්ව වාරික ප්‍රමාණය සඳහන් කල යුතුය.
- මීට පෙර ලබාගෙන ඇති 85% ක ණය මුදලක් අයවීමට ඇත්නම් එය ගෙවා නිරවුල් කල යුතුය.
- වැටුපෙන් 40% උපරිම සීමාවට යටත්ව ඉල්ලුම්කර ඇති වාරික ගණන හා අනුමත ණය මුදල තීරණය කෙරේ.

## කොන්දේසි/ අවශ්‍ය ලිපි ලේඛණ

- බැඳුනු දිනය, නැවත බැඳුනු දිනය, විශ්‍රාම ලබන දිනය, නිනොනො කාල සීමාව, සේවය අත්හිටුවා ඇත්නම් එම කාලසීමාව නිවැරදිව සඳහන් කල යුතුය.
- පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජි අංක සහ කාල සීමාවන් (වසර 18 සම්පූර්ණ වීමට ප්‍රථම යුද්ධ හමුදාවට බැඳී නැවත බඳවාගත් අයෙකු නම් පෙර සිටි ඒකක හා එම ඒකකයන්හි භාවිතා කල ආධුනික අංක, රෙජි අංක සහ කාල සීමාවන්) නිවැරදිව සඳහන් කල යුතුය.
- සෙසුනිල අධිකාරියට පත්කර ඇත්නම් සෙසුනිල අංකය හා ඒකකයෙහි විස්තර සඳහන් කල යුතුය.
- **"අයදුම්කරු විසින් සම්පූර්ණ කලයුතු කොටස"** සහ **"ඒකකය වෙතින් සම්පූර්ණ කලයුතු කොටස"** එකම පිටුවකට වන පරිදි අයදුම්පත මුද්‍රණය කල යුතුය.
- ජාතික හැඳුනුම්පතෙහි ඡායාස්ථ පිටපත ඉදිරිපත් කල යුතුය.
- ආසන්නතම මාසයෙහි වැටුප් පත්‍රිකාවෙහි සහතික කල ඡායාස්ථ පිටපත ඉදිරිපත් කල යුතුය.
- වැටුප් බැරවන බැංකු පොතේ පැහැදිලි ඡායාස්ථ පිටපත ඉදිරිපත් කල යුතුය.
- ජංගම ගිණුමක් ඇති අයෙකු නම් ජංගම ගිණුම් ප්‍රකාශයෙහි පිටපත ඉදිරිපත් කල යුතුය.

- අයඳුම්පතෙහි හා ලියකියවිලිවල සඳහන් නමෙහි (මුලකුරු සහිත නම සහ සම්පුර්ණ නම) පරස්පරතාවයක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුය.
- සියළුම ඡායාස්ථ පිටපත් ඒකක අණදෙන නිලධාරි විසින් සත්‍ය පිටපත් බවට සහතික කල යුතුය.
- කර්නල් හා ඉන් ඉහල නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ අයඳුම්පත් මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පමණක් අත්සන් කර ඉදිරිපත් කල යුතු අතර ලුතිතන් කර්නල් සහ ඉන් පහල නිලයේ සියළුම අයවළුන්ගේ අයදුම්පත් අණදෙන නිලධාරිගේ අත්සනින් යුතුව ඉදිරිපත් කල යුතුය.
- මුපළ නිගමණයකට අනුව යම්කිසි රාජ්‍ය/යුද්ධ හමුදා ආයතනයකට ඔබගේ වැටුපෙන් අයවේනම් ඉදිරියට අයවීමට ඇති මුදල සහ වාරික ගණන සඳහන් කරන්න.

<u>ප්‍රතික්ෂේප වීමට හේතු</u>

- 85 % ණය මුදල අයවෙමින් තිබියදි නැවත 85 % ණය අයදුම්පත ඉදිරිපත් කිරිම.
- අයදුම්පතෙහි සඳහන් විස්තර නිවැරදිව සම්පුර්ණ නොකිරිම.
- ඉදිරිසේවා කාලය ප්‍රමාණවත් නොවීම.
- සුවසහන ණය මුදලෙහි ණය ශේෂය තැම්පතු ශේෂයට වඩා වැඩිවීම.
- අයදුම්පත් සමග ඉදිරිපත් කරනු ලබන ලියකියවිලි පැහැදිලි නොවීම ( බැංකු පිටපත, ජාතික හැඳුණුම්පත් පිටපත, වැටුප් පත්‍රිකාව).
- වැටුප් පත්‍රිකාව අනුව බැංකු ශාඛා ගිණුම් අංක පරස්පර වීම.
- ආසන්න මාසයේ වැටුප් පත්‍රිකාව ඉදිරිපත් නොකිරීම (මාස 03කට නොවැඩි).
- දැනට යාවත්කාලින කර ඇති නව අයදුම්පත් වෙනුවට පැරණි අයදුම්පත් ඉදිරිපත්කර තිබීම.
- දැනට අයදුම්කරුගේ යාවත්කාලිනව පවතින ගිණුම් අංකය වෙනුවට පැරණි ගිණුම් අංක අයදුම්පතට ඇතුලත්කර තිබීම.
- අයදුම්කරුගේ ඉදිරිපත්කර ඇති නම සමග බැංකු පිටපත/ජාතික හැඳුණුම්පතේ පිටපත පරස්පර වීම.
- අයදුම්පතෙහි ආධුනික අංකය නොමැති වීම.
- නැවත සේවයට බැඳුණු අයෙකු නම් එම දිනය සඳහන් නොකිරීම.
- අයදුම්පත නිවැරදිව සම්පුර්ණ කර ඒකක අනි සහතික කර නොමැති අවස්ථාවකදි.
- අයදුම්පත් සමග ඉදිරිපත්කල යුතු අනිකුත් ලියකියවිලි ඒකක අනි සහතික කර නොමැති අවස්ථාවලදි.
- අයදුම්පත සමග ඉදිරිපත් කලයුතු අනිකුත් ලියකියවිලි අමුණා නොමැති අවස්ථාවන්හිදි.
- අයදුම්පත ඉදිරිපත් කරන සාමාජිකයාගේ අත්සන පරස්පර වන අවස්ථාවලදි.
- ණය මුදල ලබා ගැනිමට අවැසි සුදුසුකම් සපුරා නොමැති අවස්ථාවලදි (තැම්පතු මුදල 100,000.00 හෝ සේවා කාලය වසර 05 සම්පුර්ණකර නොතිබීම).
- පරස්පර විස්තර වෙනුවෙන් සාමදාන විනිශ්චය කරුවෙකුගේ ලිපියක් ඉදිරිපත්කර නොමැති අවස්ථාවකදි.